# III කාර්‍ය මණ්ඩල පුවත්

1. අධිපති එච්. ඊ. තෙන්නකෝන් මහතා, අග්නිදිග ආසියානු මහ බැංකු අධිපතීන්ගේ සම්මේලනයට සහභාගිවීම සඳහා 1975 ජනවාරි මස 26 වෙනි දින සිංගප්පූරුව බලා ගිය අතර, 1975 පෙබරවාරි මස 2 වැනි දින ආපසු සැපත් විය.

2. නේපාලයේ රාෂ්ට්‍ර බැංකු අධිපතිගේ ඇරයුමක් අනුව 1975 පෙබරවාරි මස 13 වැනි දින, අධිපතිතුමා නේපාලය බලා පිටත්ව ගියේය. ඉන්දියාවේ රිසර්ව් බැංකුව සමග ද නිල සාකච්ඡා පවත්වා, 1975 මාර්තු මස 3 වැනි දින එතුමා ආපසු ශ්‍රී ලංකාවට සැපත් විය.

3. ආසියානු නිෂ්පාදන සංවිධානයේ පාලක බල මණ්ඩලයේ දහත්වැනි සැසි වාරයට සහභාගිවීම සඳහා 1975 මැයි මස 15 වැනි දින අධිපතිතුමා දකුණු කොරියාව බලා පිටත්ව ගියේය. එතෙර සිටියදී හොංකොංහි, හොංකොං හා ෂැංහයි බැංකිං කෝපරේෂන් සමග නිල සාකච්ඡා පවත්වා, 1975 මැයි මස 24 වැනි දින ආපසු දිවයිනට සැපත් විය.

4. පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතීන්ගේ සම්මේලනයට සහභාගිවීම සඳහා 1975 මැයි 29 වැනි දින අධිපතිතුමා ලන්ඩනය බලා පිටත්ව ගොස්, ඉන්පසුව ජාත්‍යන්තර පියවීම් පිළිබඳ බැංකුවෙහි වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගිවීම සඳහා බාල් නගරයට ගියේය. ආසියානු නිෂ්කාශණ සංගමයෙහි සභාපති වන අධිපතිතුමා, 1975 ජූලි 19 වැනි දින ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට ප්‍රථම ටෙහෙරාන් හි පැවැති ආසියානු නිෂ්කාශණ සංගමයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමට සහභාගිවිය.

5. අධිපතිතුමා, ජාත්‍යන්තර මුල්‍ය අරමුදලෙහි ශ්‍රී ලංකාවේ විකල්ප අධිපති වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි හා ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ බැංකුවෙහි වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගි විය. 1975 අගෝස්තු 23 වැනි දින එතුමා ශ්‍රී ලංකාවෙන් බැහැරව ගිය අතර 1975 සැප්තැම්බර් 18 වැනි දින පෙරලා දිවයිනට සැපත් විය.

6. අධිපතිතුමා, එකොලොස්වැනි 'සියැන්සා' අධිපතීන්ගේ මණ්ඩලයේ සම්මේලනයට සහභාගිවීම සඳහා 1975 නොවැම්බර් 8 වැනි දින ටෙහෙරාන් බලා ගිය අතර, 1975 නොවැම්බර් 17 වැනි දින පෙරලා ශ්‍රී ලංකාවට සැපත් විය.

7. මුදල් අමාත්‍යාංශයේ ලේකම්, සී. ඒ. කුරේ මහතා මුදල් මණ්ඩලයේ ඉහුලූ සාමාජික ධුරය, 1975 ජූලි 1 වැනි දිනෙන් අවසන් විය.

8. 1975 ජූලි 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආචාර්ය එල්. ආර්. ජයවර්ධන සී. ඒ. කුරේ මහතා වෙනුවට මුදල් අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත්කරනු ලැබූ අතර, ඔහු මුදල් මණ්ඩලයට නිල බලයෙන් පත් වූ සාමාජිකයෙක් විය.

9. සී. ඒ. කුරේ මහතා හා ආචාර්ය එල්. ආර්. ජයවර්ධන නොසිටි අවස්ථාවන්හිදී මුදල් අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් එල්. බී. අබේරත්න මහතා, මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කෙළේය.

10. ආචාර්ය එච්. ඒ. ද ඇස්. ගුණසේකර නොසිටි අවස්ථාවන්හිදී ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ආචාර්ය එස්. ඒ. මීගම මුදල් මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි විය.

11. නියෝජ්‍ය අධිපති ආචාර්ය ගාමණී කොරයා, වෙළඳාම හා සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ සමුළුවේ මහ ලේකම්වරයා වශයෙන් දිගටම සේවයෙහි නිරත විය.

12. නියෝජ්‍ය අධිපති, ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් දිගටම සේවාවේ නිරත විය.

13 නියෝජ්‍ය අධිපති, පී. වී. එම්. ප්‍රනාන්දු මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නිල නම් කරන ලද අතර ඔහු බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා තෙක් අධිපතිතුමා එතෙර ගොස් සිටි කාලච්ඡේදයන් තුළදී මුදල් නීති පනතෙහි 24 වැනි වගන්තිය යටතේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය.

14. අධිපතිගේ සහකාර ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් 1975 අප්‍රේල් 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධිපති වශයෙන් පත් කරන ලදී. ආචාර්ය රාසපුත්‍රම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නිල නම් කරන ලද අතර අධිපතිතුමා එතෙර ගොස් සිටි කාලච්ඡේදයන් තුල, මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය යටතේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ඔහු කටයුතු කළේය.

15. අධිපතිගේ සහකාර එච්. එල්. ඩී. සෙල්වරත්නම් මහතා 1975 අගෝස්තු 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධිපති වශයෙන් පත් කරන ලදී.

16. ආයතන අධ්‍යක්ෂ, ඊ එරමුදුගොල්ල මහතා, විනිමය පාලක, කේ. කනගසභාපති මහතා හා රාජ්‍ය ණය අධිකාරි, ඩී. ආර්. සිරිවර්ධන මහතා 1975 අගෝස්තු 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිපතිගේ සහකාරවරුන් වශයෙන් පත් කරන ලදී.

17. මුදල් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ජේ. පී. පී. ජයසුන්දර මහතා හා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරි, සී. එච්. ප්‍රනාන්දු මහතා 1975 අගෝස්තු මස 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උපදේශක වරුන් වශයෙන් පත් කරන ලදී.

18. සමාලෝචනයට භාජනය වූ අවුරුද්ද තුල පහත සඳහන් නිලධාරීහු බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්හ.

| | | | | |
|---|---|---|---|---|
| පී. වී. එම්. ප්‍රනාන්දු මහතා | – | නියෝජ්‍ය අධිපති | – | 1975 ඔක්. 9 |
| ඒ. සී. පී. ගුණසේකර මහතා | – | අධිපතිගේ සහකාර | – | 1975 ඔක්. 9 |
| එල්. ඩබ්. ඒ. වීරසේකර මහතා | – | ලේකම් | – | 1975 නොවැ. 22 |
| ඒ. ඩී. මෝටිමර් මහතා | – | අතිරේක විනිමය පාලක | – | 1975 ජූනි 21 |

19. සේවක අර්ථසාධක අරමුදල් නියෝජ්‍ය අධිකාරි එන්. කදිර්ගාමතම්බි මහතා 1975 අගෝස්තු 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන රාජ්‍ය ණය අධිකාරි වශයෙන් පත්කරන ලදී.

20. සංවර්ධන මුදල් නියෝජ්‍ය අධ්‍යක්ෂ, වී. කේ. වික්‍රමසිංහ මහතා, 1975 අගෝස්තු 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන සංවර්ධන මුදල් අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

21. අතිරේක නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂ, ටී. ජී. පුංචිඅප්පුහාමි මහතා, (මැණික් සංස්ථාවේ සේවාවෙන් බැංකු සේවාවට ආපසු පැමිණි පසු) 1975 සැප්තැම්බර් 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වැඩ බලන ආයතන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී. කෙසේ වුවද අර්ධකාලීන වශයෙන් ඔහු තවදුරටත් මැණික් සංස්ථාවේ කටයුතු කරගෙන යයි.

22. දත්ත සැකසුම් අංශයේ කළමනාකරු, ආචාර්ය ඒ. ජී. ඒ. ඩී. පෙරේරා, 1975 සැප්තැම්බර් 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවක අර්ථසාධක අරමුදලේ වැඩ බලන අධිකාරි ලෙස පත් කරන ලදී.

UNIVERSITY OF CEYLON
LIBRARY
VIDYODAYA CAMPUS



23. නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී, වී. එස්. සුබ්‍රමානියම් මහතා, 1975 සැප්තැම්බර් 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු පරිපාලන දෙපාර්තමේන්තුවෙහි වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

24. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ඒ. එස්. ජයවර්ධන මහතා, 1975 සැප්තැම්බර් 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වැඩ බලන ලේකම් වශයෙන් පත් කරන ලදී.

25 නියෝජ්‍ය ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය කේ. එස්. ඊ. ජයතිලක, 1975 සැප්තැම්බර් මස 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, වැඩ බලන අතිරේක ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී. මීට අමතරව, 1975 සැප්තැම්බර් මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු දත්ත සැකසුම් අංශය භාරව කටයුතු කිරීමට පත් කැරිණ.

26. නියෝජ්‍ය විනිමය පාලක පී. සී. මුණසිංහ මහතා 1975 සැප්තැම්බර් මස 2 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන අතිරේක විනිමය පාලක වශයෙන් පත් කරන ලද අතර ඉන් අනතුරුව 1975 නොවැම්බර් මස 1 වැනි දින ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන විනිමය පාලක වශයෙන් පත් කරන ලදී.

27. මහ භාණ්ඩාගාරයට මුදහරිනු ලැබූ එච්. එම්. ආර්. ඇල්ලෙපොල මහතා 1975 නොවැම්බර් 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත බැංකු සේවාවට පැමිණියේය.

28. 1975 නොවැම්බර් මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආචාර්ය ටී. ඩබ්. වයි. රණවීර භාණ්ඩාගාරයට මුදා හරින ලදී.

29. 1975 ඔක්තෝබර් මස 6 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩී. එම්. මුතුබණ්ඩා මහතා මුදල් අමාත්‍යාංශයට මුදා හරින ලදී.

30. 1975 ඔක්තෝබර් මස සිට අර්ධ කාලීන පදනමක් මත එස්. රාජලිංගම් සහ එස්. ඊස්පරදසන් යන මහත්වරු සහ ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු භාණ්ඩාගාරයට මුදා හරින ලදී.

31. 1975 ඔක්තෝබර් මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තෙමසක කාලච්ඡේදයක් සඳහා වැඩ බලන සංවර්ධන මුදල් අධ්‍යක්ෂ, වී. කේ. වික්‍රමසිංහ මහතා "එස්කැප්" හි සේවය සඳහා මුදා හරින ලදී.

32. සමාලෝචනයට භාජනය වන වසර තුළදී මහ බැංකුවේ පහත සඳහන් නිලධාරීන් පූර්ණ කාලීන වශයෙන් රජයට තවදුරටත් මුදා හරින ලදී.

පී. බී. කරඳවල මහතා – නාවික හා සංචාරක අමාත්‍යාංශය
පී. එම්. හසන් මහතා – විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය